**20-03-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පුණ්‍යවන්ත ජීවයක් වීම සඳහා එක් පියාව සිහිපත් කරන්න. සිහිපත් කිරීම තුළින් පමණයි මිශ්‍ර වී ඇති ලෝහ ඉවත් වී ජීවය පාරිශුද්ධත්වයට පත්වන්නේ

**ප්‍රශ්නය:** කුමන අවධානය තිබීමෙන්ද, ඔබ කිසි දෙයක් ගැන ව්‍යාකූලත්වයට පත් නොවන්නේ?

**පිළිතුර:** නාටකය පිළිබඳ අවධානය. සිදුවන ඕනෑම දෙයක් කලින් තීරණය වූ දෙයකි කිසි දෙයක් දැන් නිර්මාණය වන්නේ නැත. සනාතන නාටකය නොකඩවා භ්‍රමණය වෙයි. මෙහි කිසි දෙයක් ගැන ව්‍යාකූලත්වයට පත් වීමට අවශ්‍ය නැත. සමහර දරුවන් මෙසේ කියයි ‘මෙය මගේ අවසන්, 84 වන උපත ද, නැද්ද කියා මම දන්නේ නෑ’. මෙසේ කියා ඔවුන් ව්‍යාකූලත්වයට පත් වෙති. බාබා පවසන්නේ ව්‍යාකූලත්වයට පත් නොවන්න. මනුෂ්‍යයෙකුගෙන් දේවතාවක් වීමට උත්සාහ දරන්න.

ඕම් ශාන්ති. ඔය දරුවන් ‘ඕම් ශාන්ති’ හි තේරුම දන්නවා, මම ජීවාත්මයක් බව සහ ජීවාත්මයක් වන මාගේ ආදිතම ධර්මය, සාමයයි. ජීවාත්මයක් වන මම, සාමයේ ප්‍රතිමූර්තියක්මි, සාම දේශයේ වැසියෙක්මි. මෙම පාඩම නොකඩවා ස්ථිර කරගන්න. මෙය ඔබට විස්තර කර දෙන්නේ කවුද? ශිව් බාබා. ඔබ සිහිපත් කළ යුත්තේ ශිව් බාබාවයි. ඔහුට ඔහුගේම රථයක් නොමැත. මේ නිසයි ඔවුන් ගවයෙක් මත, ඔහුව පෙන්වා ඇත්තේ. ඔවුන් දේවාල වල පවා ගවයෙක් තබා ඇත. මෙයට සම්පූර්ණ අවිද්‍යාව යැයි කියයි. පරමාත්ම පියා දරුවන්ට, ජීවාත්මයන්ට විස්තර කර දෙයි. එම කෙනා ජීවයන්ගේ පියා වන, ශිවාය. ඔහුට නම් රාශියක් තිබේ. කෙසේවෙතත්, ඔහුට නම් බොහොමයක් තිබීම නිසා මිනිසුන් ව්‍යාකූලත්වයට පත් වී ඇත. ඇත්ත වශයෙන්ම ඔහුගේ නම ශිවාය. ශිවාගේ උපන් දිනය සමරන්නේ භාරතයේය. ඔහු අශරීරික බාබායි. ඔහු පැමිණ අපවිත්‍ර අය පාරිශුද්ධත්වයට පත් කරයි. සමහරු ඔහුට භාග්‍යවන්ත රථය (භගීරත්) යැයිද, සමහරු ඔහුට ගවයා (නන්දිගන්) යැයිද කියයි. ඔහු පැමිණෙන්නේ කුමන භාග්‍යවන්ත රථයේද කියා ඔබට කියන්නේ පියා පමණයි. මම බ්‍රහ්මා ගේ ශරීරය තුළට ඇතුළු වන්නෙමි. මම බ්‍රහ්මාගේ මාර්ගයෙන් භාරතය දෙව්ලොව බවට පත් කරවන්නෙමි. එය ලක්ෂ්මි සහ නාරායනගේ රාජධානිය වූ බව, භාරතයේ මිනිසුන් වන ඔබ සියලු දෙනාම දන්නවා. භාරතයේ දරුවන් වන ඔබ සියලු දෙනාම, අයත් වූයේ, ආදි සනාතන දෙවි දේවතා ධර්මයටයි. ඔබ දෙව්ලොව වාසීන් විය. වසර 5000 කට පෙර මම පැමිණි විට, මම ඔබ සියලු දෙනාම, සතෝප්‍රධාන් දිව්‍ය ලෝකයේ අධිපතියන් බවට පත්කළෙමි. ඉන්පසු අනිවාර්යෙන්ම ඔබට පුනරුත්පත්ති ගැනීමට සිදු විය. පියා ඔබට සෑම දෙයක්ම සෘජුවම කියයි. ඔබ ශිවාගේ උපන් දිනය සමරන විට, ඔබ කියන්නේ එය ශිවාගේ 85 වන ජන්ම දිනය කියාය, එනම්, බාබා පළමුව ආ දින සිට වසර 85 ක් ගත වී ඇත කියාය. (1936-2021). මේ සමගම බ්‍රහ්මා, විෂ්ණු සහ ශංකර් ගේ උපත ද ඇත. ඔවුන් ත්‍රිමූර්ති බ්‍රහ්මා ගේ උපන් දිනය පෙන්වන්නේ නැත. මෙය පෙන්වීමට අවශ්‍යයි මන්ද, බාබා පවසන්නේ මම නැවත වරක් බ්‍රහ්මා ගේ මාර්ගයෙන් ස්ථාපනය සිදු කරන්නෙමි. මම නොකඩවා බ්‍රහ්මින්වරුන් නිර්මාණය කරන්නෙමි. එබැවින් බ්‍රහ්මාගේ මෙන්ම, බ්‍රහ්මිණ් වංශයට අයත් අයගේ උපන් දිනය ද තිබේ. ඔබ ඉන්පසු විෂ්ණුගේ දේශයේ අධිපතියන් බවට පත් වන බව, මම ඔබට කියන්නෙමි. ඔබ තුළ ඇති මිශ්‍ර ලෝහ ඉවත් වන්නේ, පියාගේ සිහිපත් කිරීම තුළින් පමණයි. භාරතයේ ඉපැරණි යෝගාව, නම් දරා ඇති මුත් එය ඉගැන්වූයේ කවුරුන්ද කියා කිසිවෙකු නොදනී. ඔහුම පවසන්නේ අහෝ දරුවනි, ඔබගේ පියාව සිහිපත් කරන්න! ඔබට ඔබගේ උරුමය ලැබෙන්නේ මාගෙනි. මා ඔබගේ පියායි. මම සෑම චක්‍රයකම පැමිණෙන්නෙමි. මා පැමිණ ඔබව මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය කරන්නෙමි, මන්ද, ඔබ දේවතාවන්ව සිට ඉන්පසු උපත් 84 ක් ගැනීමෙන් අපවිත්‍ර වූ බැවින්. ඔබ අනුගමනය කරන්නේ රාවණ් ගේ උපදෙස්ය. පරමාත්ම දෙවියන්ගේ උපදෙස් අනුගමනය කිරීමෙන් ඔබ දෙව්ලොව අධිපතියන් බවට පත් වෙයි. පියා පවසන්නේ මම පෙර චක්‍රයේද පැමිණියෙමි. සිදු වූ ඕනෑම දෙයක්, සෑම චක්‍රයකදීම නොකඩවා සිදු වෙයි. පියා පැමිණ නැවත මොහු තුළට ඇතුළු වෙයි. ඔහු මෙම දාදාට විමුක්තිය දෙයි. ඉන්පසු ඔහු, ඔබ සියල්ලන්ව පෝෂණය කරවයි. සත් යුගයේ සිටියේ ඔබ පමණක් බව ඔබට වැටහෙයි. භාරතයේ ජනතාව වන අප පමණයි, උපත් 84 ක් ගත යුත්තේ. මුලදී, ඔබ සියලු ගුණධර්මයන් ගෙන් සපිරි, දිව්‍යමය අංශක 16 කින් පිරී පැවතිණි. ඔබ සියල්ලන්ම අංකානුසාරයෙන් විය - රජ, බිසව සහ වැසියන්. සෑම කෙනෙකුටම රජෙක් විය නොහැක. පියා විස්තර කරන්නේ ඔබ සත් යුගයේ උපත් 8 ක් ගනී, ත්‍රේතා යුගයේ උපත් 12 ක් ගනී. මේ අන්දමින් ඔබ, ඔබ ගේ චරිත කොටස් රඟ පා ඇති අන්දම වටහා ගන්න. පළමුවෙන්ම ඔබගේ

චරිත කොටස් රඟ පෑවේ සූර්ය වංශික රාජධානියේය, ඉන්පසු චන්ද්‍ර වංශයේය. ඉන්පසු ඔබ පාපයේ මාර්ගයට ගොස් නොකඩවා පහළට බැස්සේය. ඔබ උපත් 63 ක් ගත්තා. සම්පූර්ණ උපත් 84 ම ගන්නේ භාරතයේ ජනතාවයි. අන් ආගම් වල කිසි කෙනෙක් මේ තරම් උපත් ගණනාවක් ගන්නේ නැත. ගුරු නානක් පැවතී, දැනට වසර 500 ක්ය. ඔහුට දළ වශයෙන් උපත් 12 හේ සිට 14 ක් තිබෙන්නට ඇති. මෙය ගණනය කරයි. ක්‍රිස්තියානුවන් වසර 2000 දී පුනරුත්පත්ති 60 ක් පමණ ගනී. වර්ධනය දිගටම සිදු වන අතර ඔවුන් නොකඩවා පුනරුත්පත්ති ගනී. ඔබ පමණක් උපත් 84 ක් ගන්නා අන්දම ගැන සිතීමට ඔබගේ බුද්ධිය භාවිත කරන්න. ඔබ දැන් නැවතත් සතෝප්‍රධාන් විය යුතුයි. ගෙවී ගිය සෑම දෙයක්ම නාටකයේ තිබිණ. නාටකයේ නිර්මාණය වී ඇති සෑම දෙයක්ම නැවතත් සිදු වෙයි. බාබා ඔබව අසීමිත ඉතිහාසයට රැගෙන යයි. ඔබ නොකඩවා පුනරුත්පත්ති ගෙන ඇත. ඔබ දැන් ඔබගේ උපත් 84 සම්පූර්ණ කර ඇත. ඔබගේ නිවස සාමයේ දේශය බව, පියා ඔබට නැවත මතක් කර දී ඇත. ජීවාත්මයක ස්වරූපය කුමක්ද? තිතක්. එහි තිත් සහිත ගසක් ඇත්තා සේය. ජීවාත්මයන්ගේ අංකානුසාර ගසක් ඇත. ඔබ පහළට එන්නේ අංකානුසාරයටයි. උත්තරීතර ජීවාත්මයද තිතකි. ඔහුට එතරම් විශාල ඕවලාකාර ස්වරූපයක් නැත. පරමාත්ම පියා පවසන්නේ ඔබ මගේ දරුවන් වෙයි. එබැවින් මම ඔබව දෙව්ලොව අධිපතියන් බවට පත් කරවන්නෙමි. පළමුව ඔබ පැමිණ මාහට අයත් වෙයි, ඉන්පසු මම ඔබට උගන්වන්නෙමි. බාබා, මම අයත් වන්නේ ඔබටයි කියා ඔබ කියයි. ඒ සමඟම ඔබ ඉගෙන ගැනීම ද කළ යුතුයි. ඔබ මට අයත් වූ විගසම, ඔබගේ ඉගෙනුම ආරම්භ වෙයි. බාබා පවසන්නේ මේ ඔබගේ අවසන් උපතයි. නෙළුම් මලක් මෙන් පාරිශුද්ධ වන්න! දරුවන් බාබාට පොරොන්දු වෙයි බාබා, මම කිසි විටෙක අපවිත්‍ර වන්නේ නැත, මම මගේ උරුමය ඔබගෙන් හිමි කරගන්නෙමි. අපි උපත් 63 ක් අපවිත්‍ර වී ඇත. මෙය උපත් 84 හි කතා පුවතයි. භෞතික පියෙක් ඔබට කියන ආකාරයටම, බාබා පැමිණ ඔබට සෑම දෙයක්ම කියා, එය ඉතා පහසු කරවයි. එම කෙනා අසීමිත පියායි. ඔහු පැමිණ ඔය ජීවයන්ට දරුව, දරුව! කියා කතා කරයි. මිනිසුන් ශිවා ගේ රාත්‍රිය සමරයි (ශිව රාත්‍රි). චක්‍රයෙන් භාගයකට දහවලත්, භාගයකට රාත්‍රියත් ඇත. එය දැන් රාත්‍රියේ අවසානය සහ දහවලේ ආරම්භය අතර සංගමයයි. භාරතයේ සත් යුගය පැවතුණු කල එය දහවල විය. සත් යුගය සහ රිදී යුගය බ්‍රහ්මාගේ දහවල යැයි කියනු ලබයි. ඔබලා බ්‍රහ්මින්වරුන්, නොවේද? ඔබගේ රාත්‍රිය දැන් අවසන් වන බව ඔය බ්‍රහ්මින්වරුන්ට වැටහෙයි. භක්තිය දැන් තමෝප්‍රධාන්ය. මිනිසුන් දොරක් ගානේ රස්තියාදු වෙමින් සෑම කෙනෙකුටම වන්දනාමාන කරයි. ඔවුන් මහ පාරේ ටී-මංසන්ධි වල පවා වන්දනාමාන පවත්වයි. ඔවුන් මනුෂ්‍යයින්ගේ ශරීර වලට පවා වන්දනා කරයි. සන්‍යාසීන් තමන් ගැන ‘ශිවෝහම්’ (මම ශිවාය) යැයි කියා, කොහේ හෝ වාඩි වෙන අතර, කාන්තාවන් ගොස් ඔවුන්ව වන්දනා කරයි. බාබාට බොහෝ අත්දැකීම් තිබේ. බාබා කියන්නේ මම ද බොහෝ වන්දනාමාන පැවැත්වූ නමුත්, එම කාලයේදී මට දැනුම තිබුණේ නැත. මම මිනිසුන්ට පළතුරු සහ කිරි පූජා කළෙමි. එයද මුලාවකි. කෙසේවෙතත්, ඒ සෑම දෙයක්ම නැවත සිදු වෙයි. භක්තිවන්තයන්ගේ ආරක්ෂකයා පරමාත්ම දෙවියන්ය, මන්ද සියලුම දෙනා ශෝකයෙන් සිටින බැවින්. පියා විස්තර කරන්නේ තඹ යුගයේ සිට ඔබ ගුරුවරුන් වෙතට ගිය අතර, භක්ති මාර්ගයේ නොකඩවා පහළට බැස්සේය. දැන් වුවද තාපසයින් නොකඩවා ආධ්‍යාත්මික උත්සාහයන්ගේ යෙදී සිටියි. පරම පියා පවසන්නේ මම ඔවුන්වද ඉහළ නංවන්නෙමි. ඔබ සංගම් යුගයේදි විමුක්තිය ලබා, ඉන්පසු උපත් 84 ක් ගනී. පියාට, දැනුමේ සාගරය, මනුෂ්‍ය ලෝක වෘක්ෂයේ බීජය, සත්‍යය, ජීවමාන ජීවය සහ ආනන්දයේ ප්‍රතිමූර්තිය යැයි කියයි. ඔහු කිසි දිනෙක විනාශ නොවේ. ඔහු තුළ දැනුම තිබේ. ඔහු දැනුමේ සාගරයයි, සෙනෙහසේ සාගරයයි. එබැවින් ඔබ අනිවාර්යෙන්ම ඔහුගෙන් උරුමයක් ලබා ගත යුතුයි. ඔය දරුවන් දැන් ඔහුගෙන් උරුමයක් ලබා ගනිමින් සිටියි. ඔහු ශිව් බාබායි. එම කෙනා බාබා වන අතර මෙම කෙනා ද ඔබගේ පියාය. බ්‍රහ්මාගේ මාර්ගයෙන් ශිව් බාබා ඔබට උගන්වයි, මේ නිසයි ඔබට බ්‍රහ්ම කුමර කුමරියන් යැයි කියන්නේ. බීකේ ලා බොහෝ දෙනෙක් ඇත. ඔවුන් කියන්නේ අපට අපගේ උරුමය අපේ සීයාගෙන් ලැබෙයි. ඔය දරුවන් කියන්නේ, බාබා ඔබව අපායේ වාසීන්ගෙන්, දෙව්ලොව වාසීන් බවට පත් කරවන බවයි. ඔහු පවසන්නේ අහෝ දරුවනි, නිරන්තරයෙන් මා පමණක් සිහිපත් කරන්න, එවිට ඔබගේ හිස් මත ඇති පාපයේ බර පිළිස්සී යනු ඇත. ඔබ එවිට සතෝප්‍රධාන් වනු ඇත. ඔබ පිරිසිදු රත්තරං සහ සැබෑ සැරසිලිව සිටියේය. ජීවාත්මය සහ ශරීරය යන දෙකම සතෝප්‍රධාන් විය. ජීවාත්ම, සතෝ, රජෝ සහ තමෝ යන අවස්ථා තුළින් යයි. එබැවින්, ජීවාත්ම වලට තමෝගුණී ශරීරද ලැබෙයි. පරමාත්ම පියා ඔබට අවවාද කරන්නේ දරුවනි, මා සිහිපත් කරන්න! ඔබ මට අඬගසයි අහෝ පාරිශුද්ධත්වයට පත් කරන්නාණනි, පැමිණෙන්න! භාරතයේ ඉපැරණි රාජ යෝගාව ඉතා සුප්‍රසිද්ධයි. මා සමඟ යෝගා පැවැත්වීමට මා දැන් ඔබට උගන්වන්නෙමි, මන්ද එය කිරීමෙන්, ඔබ තුළ ඇති මිශ්‍ර ලෝහ පිළිස්සී යනු ඇත. මා සිහිපත් කරන තරමට වැඩියෙන් මිශ්‍ර ලෝහ ඉවත් වනු ඇත. ප්‍රධානතම දෙය සිහිපත් කිරීමය. පියා ඔබට දැනුම දී ඇත. සත් යුගයේ,

රජවරුන්, බිසෝවරුන් සහ වැසියන් යන සියල්ලම පාරිශුද්ධයි, එහෙත් දැන් ඔවුන් සියල්ලම අපවිත්‍රයි. පියා පවසන්නේ මම මොහුගේ උපත් රාශියක අවසන් උපතේ, අවසානයේදී, මොහු තුළට ඇතුල් වන්නෙමි. මෙම කෙනාට භාග්‍යවන්ත රථය යැයි කියයි. මෙම කෙනා ඉගෙන ගෙන, අංක එක හිමි කර ගනී. සෑම කෙනෙක්ම අංකානුසාරයෙන් වන නමුත්, එක් ප්‍රධාන නමක් ඇත. පරම පියා ඔබට උපත් 84 හි වැදගත්කම හොඳින් විස්තර කර දී ඇත. ඔබ අයත් වන්නේ ආදි සනාතන දෙව් දේවතා ධර්මයටයි, හින්දු ආගමට නොවෙයි. ඔබ ශ්‍රේෂ්ඨ ධර්මයට අයත් වූ අතර ඔබ ශ්‍රේෂ්ඨ ක්‍රියාවන් සිදු කළේය. ඉන්පසු රාවණ් පැමිණි විට, ඔබ ඔබගේ ධර්මයේ සහ ක්‍රියාවන්හි දූෂිත විය. තමන්ට දේවතාවන් යැයි කියා ගැනීමට ඔබ ලැජ්ජා විය, ඒ නිසයි ඔබට හින්දූන් යන නම දෙන ලද්දේ. ඇත්ත වශයෙන්ම, ඔබ මුලින්ම අයත් වූයේ ආදි සනාතන දෙව් දේවතා ධර්මයටයි. ඔබ උපත් 84 ක් ගෙන අපවිත්‍ර වී ඇත. උපත් 84 හි චක්‍රය භාරතයේ මිනිසුන්ටයි. සෑම කෙනෙක්ම ආපසු නිවහනට යා යුතුයි. ඔබ පළමුවෙන්ම යයි, පෙරහැරක් ලෙසින්ම. ශිව් බාබාට මනමාලයා යැයි කියයි. මෙකල ඔය මනමාලියන් අපවිත්‍ර සහ තමෝප්‍රධාන්ය. එබැවින් ඔහු ඔබව අලංකාර කර ආපසු නිවහනට රැගෙන යයි. ජීවාත්මයන් වන ඔබව පාරිශුද්ධත්වයට පත් කර ඔහු ආපසු ඔබව නිවහනට රැගෙන යයි. ඔහුට විමුක්තිය ලබා දෙන්නා මෙන්ම මඟ පෙන්වන්නා යැයි ද කියයි. අසීමිත පියා ඔබව ආපසු නිවහනට ගෙන යයි. ඔහුගේ නම කුමක්ද? ශිව් බාබා. නමක් තබන්නේ ශරීරයකටයි, එහෙත් පරමාත්ම දෙවියන් ගේ නම ශිවාය. බ්‍රහ්මා, විෂ්ණු සහ ශංකර්ට සූක්ෂම ශරීර ඇත. ශිව් බාබාට ඔහුටම කියා ශරීරයක් නොමැත. ඔහුට නිකම්ම ශිව් බාබා යැයි කියයි. දරුවන් කියන්නේ ඔහෝ මව සහ පියා, අපි ඔබගේ දරුවන් වී ඇත. අන් අය දිගින් දිගටම අඬ ගසයි, මන්ද ඔවුන් ඔහුව නොදන්න නිසා. සෑම කෙනෙක්ම ඔහුව දැන ගත්තේ නම්, කුමක් සිදුවේද කියා කිව නොහැක! දේවතා වෘක්ෂයේ අංකුරය දැන් පැළ කරමින් තිබේ. දියමන්තියකින් කවුවක් බවට පරිවර්ථනය වීමට උපත් 84 ක් ගත වෙයි. ඉන්පසු චක්‍රය නැවත අළුතින් ආරම්භ වෙයි. ලොවෙහි ඉතිහාසය සහ භූගෝලය නැවත සිදු වෙයි. ඔබ සම්පූර්ණ උපත් 84 ම ගෙන ඇති බව පියා විස්තර කරයි. එය උපත් මිලියන 8.4 ක් විය නොහැක. එය විශාල වැරදීමකි. උපත් මිලියන 8.4 ක් ඇති බව විශ්වාස කරන නිසා, ඔවුන් චක්‍රයේ කාලය වසර සිය දහස් ගණනක් බව කියා ඇත. එය සම්පූර්ණ මුසාවකි. භාරතය දැන් මුසාවේ දේශයයි. ඔබ සත්‍ය දේශයේ නිරන්තර සතුටින් විසුවේය. මේ කාලයේදී ඔබට උපත් 21 කට ඔබගේ උරුමය ලැබෙමින් තිබෙයි. සෑම දෙයක්ම රඳා පවතින්නේ ඔබගේ උත්සාහයන් මතයි. රාජධානියේ ඔබ කැමති ඕනෑම තත්ත්වයක් ඔබට හිමි කර ගත හැක. මෙහි දී මැජික් පිළිබඳ ප්‍රශ්නයක් නොමැත. ඔව්, ඔබ අනිවාර්යෙන්ම මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය වෙයි. එය හොඳ මැජික් එකක් නොවේද? ඔබ තත්පරයකින් බාබාගේ දරුවන් වන බව ඔබට වැටහෙයි. සෑම චක්‍රයකදීම බාබා ඔබව දෙව්ලොව අධිපතියන් බවට පත් කරවයි. චක්‍රයෙන් භාගයක්ම ඔබ එහෙ මෙහෙ සැරි සැරූ මුත්, ඔබගෙන් එක්කෙනෙක් වත් දෙව්ලොව වැසියෙක් වී නැත. පරමාත්ම පියා පැමිණ ඔය දරුවන්ව වටිනා අය බවට පත් කරවයි. මහාභාරත යුද්ධය සත්‍යයෙන්ම තිබූ අතර, ඔබට රාජ යෝගාව උගන්වන ලදි. ශිව් බාබා පවසන්නේ ක්‍රිස්තුස් වහන්සේ නොව, මම පැමිණ ඔබට උගන්වන්නෙමි. එය දැන් ඔබගේ උපත් රාශියක අවසන් උපතයි. ව්‍යාකූලත්වයට පත් නොවන්න. ඔබ භාරත වාසීන්ය. ඔබගේ ධර්මය බොහෝ සතුට ලබා දෙන එකකි. අන් ආගම් වල අයට දෙව්ලොව යා නොහැක. මෙම නාටකය සදාකාලයටම පෙර තීරණය වූ එකකි. එය නිර්මාණය කළේ කවදාද කියා ඔබට ඇසිය නොහැක. එයට අවසානයක් නොමැත. ලොවෙහි ඉතිහාසය සහ භූගෝලය නැවත නැවතත් සිදු වෙයි. මෙය කුඩා සංගම් යුගයයි. බ්‍රහ්මින්වරුන් හිසෙහි ඉහළ ගැටයයි. පියා ඔය බ්‍රහ්මින්වරුන්ව දේවතාවන් බවට පත් කරවමින් සිටියි. එබැවින් ඔබ අනිවාර්යෙන්ම බ්‍රහ්මාගේ දරුවන් බවට පත් විය යුතුයි. ඔබට ඔබගේ සීයාගෙන් උරුමයක් ලැබෙයි. තමන් බීකේ කෙනෙක් යැයි සළකන තෙක්, ඔබට උරුමයක් ලැබෙන්නේ කෙසේද? කෙසේවෙතත්, ඔබ දැනුම ටිකක් ඇසූ විට, ඔබ සාමාන්‍ය වැසියන්ගෙන් කොටසක් බවට පත්වෙයි. සෑම කෙනෙක්ම අනිවාර්යෙන්ම එහි යා යුතුයි. ශිව් බාබා, බ්‍රහ්මිණ්, දේවතා සහ, ක්ෂත්‍රිය යන ආගම්, බ්‍රහ්මාගේ මාර්ගයෙන් ස්ථාපනය කරමින් සිටියි. ගීතාව හැරුණු කොට, ආගමික ග්‍රන්ථයක් නොමැත. එය තුළින් ආගම් තුනක් ස්ථාපනය කරන, ගීතාව, වඩාත්ම ශ්‍රේෂ්ඨ දෙව් දේවතා ධර්මයේ ග්‍රන්ථයයි. බ්‍රහ්මින්වරුන් නිර්මාණය කරන්නේ මෙහිදිය. ඔබ දේවතාවන් බවට පත් වන්නේ මෙහිදීය. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සැම දෙනාගේම චරිත කොටස නියම වී ඇති බව වටහා ගෙන, නිරන්තරයෙන් සැහැල්ලුවෙන් සිටින්න. පෙර තීරණය වූ දේ සිදුවෙමින් පවතී. එබැවින් නාටකය පිළිබඳව නොසැලී සිටින්න.
2. මෙම කෙටි සංගම යුගයේදී ඔබගේ සම්පූර්ණ උරුමය පියා ගෙන් හිමි කර ගන්න. සිහිපත් කිරීමේ බලයෙන් මිශ්‍ර ලෝහ ඉවත් කර, තමන්ව කටුවකින් දියමන්තියක් බවට පත් කර ගන්න. සුම්හිරි වෘක්ෂයේ අංකුරයේ කොටසක් බවට පත් වීමට, වටිනා කෙනෙක් වන්න.

**වරදානය:** ඔබ නොබැඳි නිරීක්ෂකයෙකු වී, නිරන්තරයෙන් ඒකායන පරම පියාගේ ස්මරණයේ නිමග්න වී, එමගින් ඔබේ අවධිය නියත හා ස්ථාවර කර ගනිත්වා.

ඔබ කිසිදා සිතුවේවත් සිහිනෙන්වත් නොසිතූ එවැනි පරීක්ෂණ පත්‍රිකා දැන් පැමිණීමට නියමිතයි. කෙසේ වෙතත්, ඔබේ හැසිරීම සීමිත නාටකයක් නරඹන ආකාරයට, නොබැඳි නිරීක්ෂකයෙකු ලෙස වේවා. එය ඛේදවාචකයක් හෝ විකටයක් වුවත්, එහි කිසිදු වෙනසක් සිදු නොවනු ඇත. එලෙසම, යමෙකුට විනෝදාත්මක කොටසක් තිබිය හැකි අතර තවත් සෙනෙහෙවන්ත ජීවාත්මයකට බරපතල කොටසක් තිබිය හැකිය. එක් එක් අයගේ චරිත කොටස නොබැඳි නිරීක්ෂකයෙකු ලෙස නරඹා ඔබේ අවධිය නියත හා ස්ථාවරව තබා ගන්න. කෙසේ වෙතත්, ඔබට එවැනි අවධියක් තිබිය හැක්කේ ඔබ නිරන්තරයෙන් එකම එක පරම පියාගේ ස්මරණය තුළ නිරත වූ විට පමණි.

**පාඨය:** අධිෂ්ඨානශීලී විශ්වාසයෙන් (නිෂ්චේ) ඔබේ වාසනාව ස්ථාවර කර ගන්න (නිෂ්චිත්) එවිට ඔබ නිරන්තරයෙන් බාධක වලින් නිදහස් (නිෂ්චිත්) වනු ඇත.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත් සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයෙ අත්තිවාරම ශක්තිමත් කර, නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න.**

ඔබ කිසිවක් කිරීමට පෙර, ඔබේ ජයග්‍රහණය දැනටමත් සහතික කර ඇති බවත්, ඔබ බොහෝ වක වලින් ජයග්‍රහණය කර ඇති බවත් විශ්වාසය තබා ගන්න. ඔබ බොහෝ වක්‍ර ජයගෙන ජයග්‍රාහී ජපමාලයේ සිරවී සිටින බැවින්, ඔබ දැන් එය නැවත කළ යුතුයි. ඔබට කළ යුතුව ඇත්තේ කලින් නියම කර ඇති ක්‍රියාවන් නැවත කිරීම පමණි. ඒවා කලින් නියම කර ඇති බව පවසන්නේ එබැවිනි. ඒවා කලින් නියම කර ඇති අතර ඔබ දැන් ඒවා නැවත වරක් පුනරාවර්තනය කරමින් "පෙර නියම කර ඇති දේ කිරීම" යන කියමන ඉටු කරයි.